# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1973 සැප්තැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 06 වන දින]**

එල්. ඩී.—ඕ. 82/72

**බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 41 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උප වගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 318 වන අධිකාරයේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(6අ) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වා ගෙන යනු ලබන ඒ ලේඛනයක ගොනු කරන ලද එකී ආකෘති පත්‍රයක පිට පතක් නැති වූ, එයට හානි සිදු වූ, එය කියවිය නොහැකි බවට පත් වූ හෝ කියවිය නොහැකි බවට පත්වීමට ඉඩ ඇත්තා වූ ද එකී පිටපතේ අනුපිටපතක් නිකායක මහානායක ස්ථවිර යන් වහන්සේ විසින් හෝ නායක ස්ථවිර කෙනකුන් වහන්සේ විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනයක ඇත්තා වූද අවස්ථාවක, එකී මහා නායක ස්ථවිරයන් වහන්සේ හෝ නායක ස්ථවිරයන් වහන්සේ විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනය සමග හරිවැරදි බැලීමෙන් පසුව පිළියෙළ කරනු ලැබූ බවටත් ඒ අනුපිටපතේ සත්‍ය පිටපතක් බවටත් තමා විසින් සහතික කරනු ලැබූ ඒ අනුපිටපතේ පිටපතක් නිසි විභාගයකින් පසු එකී ආකෘති පත්‍රයේ පිටපත වෙනුවට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ආදේශ කරවිය හැකි ය.

(6ආ) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනයක ගොනු කරන ලද එකී ආකෘති පත්‍රයක පිටපත සහ නිකායක මහා නායක ස්ථවිරයන් වහන්සේ හෝ නායක ස්ථවිර කෙනකුන් වහන්සේ විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනයක ගොනු කරන ලද එහි අනුපිටපත—

(අ) යන දෙකට ම හානි සිදු වූ හෝ ඒ දෙකම කියවිය නොහැකි බවට පත්වීමට ඉඩ ඇත්තා වූ අවස්ථාවක, ආදේශ කිරීමට හේතු ද පිටපතේ සඳහන් විස්තර ලබාගත් මාර්ගය ද දැක්වෙන තමාගේ සහතිකයක් සහිතව ඒ ආකෘති පත්‍රයේ පිටපතක් තමා අවශ්‍ය යයි සලකන විභාගයකින් පසුව ඒ වෙනුවට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තම ලේඛන යෙහි ආදේශ කරවිය හැකි ය ; නැතහොත්

(ආ) යන දෙකම නැති වූ හෝ කියවිය නොහැකි බවට පත්වී ඇත්තා වූ අවස්ථාවක—

ජ 00426—10,332 (73/7)

(i) යෝජිත ආදේශ කිරීමට හේතු ද ආදේශ කිරීමට යෝජනා කරන විස්තර ද ඒ විස්තර ලබාගන්නා ලද්දේ කිනම් සාක්ෂි පදනම් කොටගෙන ද යන වග ද දක්වමින් නිසි දිසා අධිකරණය වෙත පූර්ණ වාර්තාවක් සැපයීමෙන් පසු ව, සහ

(ii) ඒ දිසා අධිකරණය විසින් එම අධිකරණය අවශ්‍ය යයි සලකන විභාගයක් පැවැත්වීමෙන් ද එසේ ම අවශ්‍ය යයි සලකන දැනුම්දීම් කිරීමෙන් ද ඉක්බිති එම අධිකරණය යෝග්‍ය යයි සලකන ආදේශ කිරීමක් කිරීමට ඒ අධිකරණය විසින් බලය පවරනු ලැබීමෙන් පසුව

පමණක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඒ වෙනුවට ඒ ආකෘති පත්‍රයේ පිටපතක් තම ලේඛනයෙහි ආදේශ කරවිය හැකි ය.

මේ උපවගන්තිය යටතේ දිසා අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන කිසිම නඩුකටයුත්තක් වෙනුවෙන් කිසිම මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු නොවන්නේ ය.

(6ඇ) (6අ) වන උපවගන්තියේ හෝ (6ආ) වන උපවගන්තියේ විධිවිධාන අනුව සහතික කරන ලද සෑම පිටපතක් ම, එයින් ප්‍රතියෝජනය කෙරෙන මුල් පිටපත ලෙස සලකනු ලැබිය යුතු ය.".